# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/10 - 2020 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2020.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (5) වැනි ව්‍යවස්ථාවට අනුකූලව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සහ අතිගරු ජනාධිපතිතුමන් විසින් ''කැබිනට් නොවන අමාත්‍යවරුන් වෙත විෂයයන් හා කාර්යයන් පැවරීම'' යන මැයෙන් 2019.12.10 දින ඉදිරිපත් කරන ලදුව අමාත්‍ය මණ්ඩලය විසින් සම්මත කළ අංක : 19/3391/201/005 අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යවරයා වන මා විසින් මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් පරිදි ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයා වෙත කාර්යයන් හා කර්තව්‍යයන් දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා සහ ක්‍රියාත්මක කළයුතු නීති හා අණපනත් මෙයින් පවරා දෙනු ලැබේ.

ඩග්ලස් දේවානන්දා (පා.ම),
ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය.

**උපලේඛනය**

**ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති සහ අණ පනත්* |
|---|---|---|
| 1. සමුද්‍ර කිවුල් දිය (කලපු) හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය හා කළමනාකරණය<br>2. ජීව සහ අජීව ජාතික ජලජ සම්පත් සංවර්ධනය කිරීම<br>3. මිරිදිය මත්ස්‍ය ගොවිපල, කරවල හා වියළි මාංශ නිෂ්පාදන කටයුතු සංවර්ධනය කිරීම<br>4. මුහුදු මත්ස්‍ය වගාව ඇතුළු ජලජීවී වගා සංවර්ධනය සහ අධීක්ෂණය<br>5. ධීවර කර්මාන්තය ආශ්‍රිතව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හඳුන්වා දීම හා එම විෂය භාර අමාත්‍යාංශය සමග සම්බන්ධීකරණය<br>6. සුරතල් මත්ස්‍ය ව්‍යාපාර දියුණු කිරීමට අවශ්‍ය සානුබලයන් සැපයීම | 1. ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය<br>2. ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය | • ශ්‍රී ලංකා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය පනත (1998 අංක 53)<br>• ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය පනත (1981 අංක 54) |

1A - G 31490 — 370 (2020/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*